**ශීර්ෂය 236 - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

------------------

**1.1 මතය**

------

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 අප්‍රේල් 27 ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය - නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය - අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2012 මැයි 21 දිනැති අංක EST/8/EXAMS/05/1007-1 දරන රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලිපිය | කථන හා ලිඛිත පරික්ෂණ සඳහා අර්ධකාලීන පදනම මත බඳවාගත් නිලධාරින්ට හා සම්පත් දායකයන්ට ගෙවීමට අනුමත කර තිබුණද, දෙමළ භාෂා කථන හා ලිඛිත පරික්ෂණ පැවැත්වීම හා භාෂා පුහුණු පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරිම වෙනුවෙන් ආයතනයේ පූර්ණකාලීන සේවය කරන නිලධාරින් හට අනුමැතියකින් තොරව රු. 631,860 ක් ගෙවීම් කර තිබුණි. | විභාගය පැවැත්වීම සඳහා විශාල කාර්ය මණ්ඩලයක් අවශ්‍ය බැවින් දෙපාර්තමේන්තුවේ නිලධාරින් යොදවා ගෙන විභාග කටයුතු සිදු කර එම ගෙවීම සිදු කර ඇත. | පූර්ණකාලීන නිලධාරින්ට ගෙවීම් කිරිම සඳහා ගෙවීම් ක්‍රමවේදය අනුමත කරගත යුතු වීම. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයක් වෙනුවෙන් වු මුළු ප්‍රතිපාදනය රු.200,000 ම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණු අතර තවත් පුනරාවර්තන වැය විෂයක් වෙනුවෙන් ප්‍රතිපාදිත මුදලින් මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකිරිම් සිදුකිරිමෙන් අනතුරුවද සියයට 63කට සමාන රු.2,051,391 ක ඉතිරිවීම් නිරික්ෂණය විය. | 2021 වර්ෂයේ පැවති COVID - 19 තත්වය තුළ මෙම ප්‍රතිපාදන ඉතිරිවී ඇත. | ඇස්තමේන්තු සකස් කිරීම නියමිත පරිදි සැලසුම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 2ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 3ක් සඳහා ප්‍රතිපාදිත මුදලින් සියයට 36 ක සිට සියයට 88ක් දක්වා පරාසයක් තුල ඉතිරි වීම් තිබුණු බව නිරික්ෂණය විය. | COVID -19 තත්වය හේතුවෙන් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන කටයුතු හැර එදිනෙදා සිදු කරන කාර්යාල කටයුතු නතර කර තිබීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | ඇස්තමේන්තු සකස් කිරීම නියමිත පරිදි සැලසුම් කළ යුතු වීම. |

**2.3 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට ආරක්ෂක සේවය සපයන ට්‍රාන්ස් ඒෂියා සිකියුරිටි සිස්ටම් ආයතනය සමඟ එළඹි ගිවිසුමෙහි කොන්දේසි ප්‍රකාරව දිවා කාලයේදි එක් කාර්යභාර නිලධාරියකු හා කාන්තා නිලධාරිනියක් සේවයේ යෙදවිය යුතු වුවද, ඊට අමතරව කණිෂ්ඨ ආරක්ෂක නිලධාරියකු අනුමැතියකින් තොරව සේවයේ යොදවා තිබුණි. තවද, එම නිලධාරියා වෙනුවෙන් 2020 වර්ෂය තුලදි රු. 166,770 ක් හා 2021 වර්ෂය තුලදි රු. 359,325 ක් ගෙවා තිබුණි. | ආරක්ෂක සේවා ගිවිසුම අනුව දිවා සේවා මුරය සඳහා එක් කාර්යභාර නිළධාරියෙකු හා කාන්තා ආරක්ෂක නිළධාරියෙකු යෙදවිය යුතු වුවද සේවයේ අවශ්‍යතාව මත (විභාග රාජකාරි වෙනුවෙන් හා සෞඛ්‍ය හේතුන් මත) අමතර ආරක්ෂක නිළධාරියෙකුගේ සේවය ලබා ගෙන ඇත. | අමතර ආරක්ෂක නිලධාරියකු සේවයේ යෙදවීමේදී නිසි අනුමැතියකින් සිදුකල යුතුවීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ දූර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 හා 2016 වර්ෂවලදි සිංහල, දෙමළ පරිවර්තක මෘදුකාංගයක් සකස් කිරිම වෙනුවෙන් රු. 4,860,000 ක් හා 2017 හා 2018 වර්ෂවලදී දෙමළ, සිංහල පරිවර්තන මෘදුකාංගයක් සකස් කිරිම වෙනුවෙන් රු.5,950,000 ක් මොරටුව විශ්වවිද්‍යාලය වෙත ගෙවා තිබුණි. මෙම මෘදුකාංග තුළින් පරිවර්තන කටයුතු සිදුකිරිම සඳහා දත්ත වැඩි | මෙම භාෂා පරිවර්තන මෘදුකාංගය භාවිතා කිරීමට සුදුසු බවට තහවුරුවක් කඩිනමින් ලබා දෙන ලෙස රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අංක PMA/ADM/EST/GA19/DOL හා 2022.03.02 දිනැති ලිපිය මගින් ද එම විශ්ව විද්‍යාලයට දැනුම් දී ඇති අතර එම තහවුරුව ලබා ගැනීමෙන් | සිංහල භාෂාව දෙමළ භාෂාවටද, දෙමළ භාෂාව සිංහලටද පරිවර්තනය කිරිමේ මෘදුකාංගය භාවිතා කිරිමට අවශ්‍ය කටයුතු සකස් කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| ප්‍රමාණයක් ඇතුළත් කළ යුතු වුවද, ඒ වෙනුවෙන් නිශ්චිත ක්‍රමවේදයන් අනුගමනය කර නොතිබුණි. තවද, මෙම මෘදුකාංගවල අයිතිය තවදුරටත් මොරටුව විශ්වවිද්‍යාලය සතුව පවතින බැවින් හා දෙපාර්තමේන්තුව සතුව එවැනි මෘදුකාංගයක් පවත්වාගෙන යාමට අවශ්‍ය Server පහසුකම් නොමැතිකමින් විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධවීමකින් තොරව මෘදුකාංගය භාවිතා කිරිම අපහසු වී තිබුණි. ගිවිසුමේ නිශ්චිත එකඟතාවයන් නොතිබීම හේතුවෙන් මෙම වියදම දැරීමෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ. | පසුව අනෙකුත් ආයතනවලට එහි ප්‍රයෝජන ගැනීමට පහසුකම් සැලසිය හැක. | |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු 6ක්ද, තෘතියික මට්ටමේ තනතුරු පුරප්පාඩු 34 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 2 ක්ද වූ අතර, ද්විතියික මට්ටමේ තනතුරුවල අතිරික්ත සේවක සංඛ්‍යාව 03ක් විය. සමාලෝචිත වර්ෂයේදී පුද්ගල පඩිනඩි වියදම රු. 98,545,710 ක් විය. | දෙපාර්තමේන්තුගත තනතුරු දැරූ නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම මත ද්විතියික මට්ටමේ නිලධාරීන්ගේ අතිරික්තයක් ඇති වී ඇති බව දන්වා සිටිමි. ඒ ඒ ආයතන වෙතම දැනටමත් නිලධාරීන් 16 දෙනෙකු අනුයුක්ත කර ඇත. දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ, තෘතියික හා ප්‍රාථමික මට්ටම් වල පුරප්පාඩු පිළිබඳව ද ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇති අතර, දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටි සකස් කරමින් පවතී. | බඳවා ගැනීමේ පටිපාටි සකස් කර තනතුරු පුරප්පාඩු පිරවීමට හා අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබා ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) 1999 වර්ෂයේ සිට භාෂා පරිවර්තක සහකාර ලෙස සේවයට බඳවාගෙන ඇති නිලධාරින් 42 දෙනෙකු පලාත් පාලන ආයතන හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවය සඳහා මුදාහැර තිබුණි. 2021 වර්ෂය සඳහා මෙම නිලධාරින්ට රු. 26,461,700 ක් වැටුප් හා දීමනා ලබා දී තිබුණ ද, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් කාර්ය පැවරුම් සිදුකර දෙපාර්තමේන්තුවට සේවාවක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | දැනටමත් නිලධාරීන් 16 දෙනෙකු ඒ ඒ ආයතනවලටම අනුයුක්ත කර ඇති අතර තවදුරටත් දෙපාර්තමේන්තුව යටතේ වෙනත් ආයතනවල සේවය කරන නිලධාරින්ට රාජකාරී පැවරීමට කටයුතු කර ඇත. | නිලධාරින් හට කාර්ය පැවරුම් සිදුකර දෙපාර්තමේන්තුවට සේවාවක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වීම. |